**නගර හා කඩවත් සතර ප්‍රාදේශීය සභාව - 2021**

**--------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**-----------------**

### 1.1 තත්ත්වාගණනය කළ මතය

**-----------------------------**

නගර හා කඩවත් සතර ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට නගර හා කඩවත් සතර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**--------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

**------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

**------------------------------------------------------------------------------------------**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව

විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීම , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිති රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පුද්ගලික ඉඩම් කට්ටි කිරීමේදි ප්‍රදේශීය සභාවේ පොදු භාවිතය සඳහා ඔප්පු සකස්කර පවරා තිබූ අක්කර 03ක වපසරියකින් යුත් රු.8,800,000ක් වූ ඉඩමේ වටිනාකම ගිණුම්ගතකර නොතිබුණි. | අක්කර 03ක වපසරියකින් යුත් ඉඩම්වල ප්‍රත්‍යාගණන කටයුතු සිදුකෙරේ. | ඉඩමේ නිවැරදි වටිනාකම ගිණුම්ගත කළයුතුය. |

### 1.6.2 නොසැසඳූ පාලන ගිණුම්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර ඇති ගිණුම් විෂයන් 05ක් සඳහා මූල්‍ය ප්‍රකාශන සහ මූලික ලියවිලි ශේෂ අතර රු. 4,970,100ක වෙනස්කම් පැවැති බව නිරීක්ෂණය විය. | නියමිත ක්‍රියාමාර්ග ගනු ලැබේ. | වෙනස නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

### නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | මු.රෙ.371 | 345,520 | ගෙවනු ලැබූ සියළුම අත්තිකාරම් කාර්ය නිම කළ වහාම නිරවුල් කළයුතු බව සඳහන් වුවත්, මාස 09 සිට වර්ෂ 04ක් දක්වා කාල පරාසයකින් අත්තිකාරම් නිරවුල් කර නොතිබුණි. | අරමුදල් ලද විගස පියවර ගනු ලැබේ. | අත්තිකාරම් ලබාගෙන අරමුණු ඉටුවූ වහාම නිරවුල් කළ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ආ) | මුදල් රෙගුලාසි 880 හා 2021 අගෝස්තු 16 දිනැති අංක PT/03/2021 දරන පළාත් මූල්‍ය චක්‍රලේඛය | 115,000 | ප්‍රාදේශීය සභාවේ රාජකාරි ඉටුකරනු ලබන ඇප මුදල් අයකළ යුතු නිලධාරීන් 18කගෙන් ආරක්ෂිත ඇප තැන්පතු අයකර නොතිබුණි. | ඉතා කඩිනමින් වැඩිදුර ක්‍රියාමාර්ග ගනු ලැබේ. | **ආරක්ෂිත ඇප මුදල් අයකිරිමට උචිත පියවර ගත යුතුය.** |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.44,237,824ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 33,738,878 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වරිපනම් හා බදු | | |
| i) | වර්ෂ 01 සිට 08ක කාලයක සිට පැවත එන හිඟහිටි දේපළ බදු රු.22,812,086ක් අයකිරිමට පියවර ගෙන නොතිබුණි. | 2021 වර්ෂයේ කොවිඩ් - 19 හේතුවෙන් ජංගම සේවාවන් ක්‍රියාත්මක කළ නොහැකිව තිබූ බව දන්වා සිටිමි. | හිඟහිටි අයකිරිමට පියවර ගත යුතුය. |
| ii) | දේපළ බදු සම්බන්ධ මුදල් ගනුදෙනු, ලදුපත් පිළියෙල කිරීම, ලදුපත් නිකුත් කිරීම වැනි කාර්යයන් සඳහා ක්ෂේත්‍ර කම්කරුවකු සහ කාර්යාල සහායකයෙකු රාජකාරියේ යෙදීම සභාව අනුමත කර තිබූ අතර එමගින් රු.3,421,402ක මූල්‍ය වංචා සමාලෝචිත වර්ෂය දක්වා සිදුවී තිබූ බව නිරීක්ෂණය විය. | සීමිත කාර්ය මණ්ඩලයක් යෙදවීමෙන් සංවර්ධන කටයුතු ඇතුළු සභාවේ සියළු කාර්යයන් සලසනු ලැබේ. | තනතුරුවලට නියමිත රාජකාරි පැවරීමට කටයුතු සිදුකළ යුතුය. |
| (ආ) | කුලී | | |
| | 1987 ප්‍රාදේශීය සභා පනතේ 129(2)(ඊ) වගන්තිය ප්‍රකාරව 2021 දෙසැම්බර් 31 දින අයකළ යුතු රු. 395,411ක් ව්‍යාපාරික ස්ථාන කුලී, නේවාසිකාගාර කුලී, ගොඩනැගිලි කුලි, වාහන කුලී සහ වෙළෙඳපොල කුලී විධිමත්ව ලබාගැනීමට පියවර ගෙන නොතිබුණි. | උචිත ක්‍රියාමාර්ග ගෙන සියළුම හිඟමුදල් විමසා බලා රැස්කිරීමට කටයුතු කරනු ලබන බව දන්වා සිටිමි. | හිඟහිටි මුදල් අයකිරිමට සුදුසු පියවර ගත යුතුය. |

(ඇ) **වෙළෙඳ බලපත්‍ර ගාස්තු**

| | | | |
|---|---|---|---|
| | 2021 දෙසැම්බර් 31 දිනට වසර 07 කට අධික කාලයක සිට පැවත එන උප්පුවෙලි උපකාර්යාලයේ රු.98,750 ක හිඟ වෙළෙඳ බලපත්‍ර ගාස්තු අයකරගෙන නොතිබුණි. | හිඟහිටි මුදල් අත්හැරීමේ කමිටු නිර්දේශ අනුව නිරවුල් කෙරේ. | රැස්කළ බලපත්‍ර ගාස්තු පිළිබඳව විගණනය දැනුවත් කළයුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍යය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කටයුතු විධිමත් කිරීම සහ පාලනය කිරීම, මහජන සුබ විහරණය, පහසුව සහ සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| **(අ)** | කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීමට දේශීය ණය සංවර්ධන අරමුදලින් ලබාගත් ණය සඳහා රු.700,438ක වාර්ෂික (වාරික) ගෙවීම සමාලෝචිත වර්ෂයේදි ගෙවා අවසන් කර තිබූ නමුත්, එය බැංකු සනාථ කිරීම් අනුව හිඟහිටිව පැවැති අතර දේශීය ණය සංවර්ධන අරමුදල ඇමැතීමෙන් හිඟහිටි මුදල් නිරවුල් කිරීම සම්බන්ධයෙන් සනාථ කිරීම් කිසිවක් ලබාගෙන නොතිබුණි. | 2022 ජූලි 11 දින සිහිකැඳවීම් යවා ඇත. | ගෙවිය යුතු හිඟමුදල් නිරවුල් කළ බවට සනාථ කිරීම් ලබාගත යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයට පෙර කාලපරිච්ඡේදයට අයත් හිඟහිටි විදුලිය සහ ජල ගාස්තු රු.142,960ක් නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි. | හිඟමුදල් හඳුනාගෙන එය සභාවේ අනුමැතිය සහිතව සම්පූර්ණයෙන් නිරවුල් කිරීමට පියවර ගෙන ඇත. | කල් ඉකුත් වූ හිඟහිටි නිරවුල් කළයුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ ත්‍රිකුණාමලය රෝහලට PCR යන්ත්‍රයක් ලබාදීමට ප්‍රජා සංවිධාන 16කින් ලබාගත් එකතුව රු.මිලියන 1ක් සේවක සුභසාධන ගිණුමේ තැන්පත් කර ඇති අතර වැඩිදුර ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | **PCR** යන්ත්‍ර මිලදී ගැනීමට රැස්කළ අරමුදල් ආපසු ගෙවීමට 2022 ජූනි 07 දිනැති සභා රැස්වීමේදි තීරණය කර අරමුදල් නියමිත ප්‍රජා සංවිධානවලට තැන්පත් කරමින් තිබුණි. | අදාල අරමුණු සඳහා උපයෝජනය/ආපසු ගෙවීමට පියවර ගත යුතුය. |
| (ඈ) | පුද්ගලික ආයතන 03කට අයත් සන්නිවේදන කුළුණු ස්ථාපිත කිරීමට ගිවිසුම්ගත වී කුලී වටිනාකම නැවත තක්සේරු කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් රු.3,149,072ක් වූ හිඟමුදල් ලබාගෙන නොතිබුණි. | මේ පිළිබඳ නිවැරදි ක්‍රියාපිලිවෙත් මෙම වර්ෂයේ සිදුකරනු ලැබේ. | ආදායම් ලබාගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඉ) | පොදු තැන්පත් ගිණුමේ සහ ලංකා බැංකුවේ පරිත්‍යාග තැන්පතු ගිණුමේ මුදල් පොත්වල ශේෂ හා බැංකු ශේෂය අතර පැවැති | පොදු තැන්පත් ගිණුමේ රු. 647,719ක ශේෂය 2003 වර්ෂයට පෙර සිටම සෑම වර්ෂයකම සිදුවූ වැරදි හේතුවෙන් මුදල් | පසුගිය කාලයේ වැරදි නිවැරදි කිරීම සඳහා ක්‍රමවේදයක් ස්ථාපිත |

| | | | |
|---|---|---|---|
| | වෙනස්කම් රු.678,226 ක් නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. | පොතේ ශේෂය සහ වර්ෂ අවසාන ශේෂය අතරත් වෙනස්කම් පැවැතුණි. අත්හැරීමේ කමිටුවේ නිර්දේශ සඳහා මෙම ගැටළු ඉදිරිපත් කර වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | කළ යුතුය. |
| (ඊ) | ප්‍රාදේශීය සභාව විසින් 2020 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය විසින් වෙන්දේසියේ විකිණීමට නිර්දේශ කළ අයිතමයන් 45ක් සමාලෝචිත වර්ෂයේදි වෙන්දේසියේ විකුණා රු. 113,500ක් ලැබී තිබූ නමුත්, සමාලෝචිත වර්ෂ මූල්‍ය ප්‍රකාශනවල මෙම අයිතමයන්ගේ පිරිවැය ගණනය කර ගිණුම්වල අඩුකර දක්වා නොතිබුණි. | 2020 වර්ෂයේ වෙන්දේසියේ විකුණූ භාණ්ඩවල පිරිවැය ලබාගත නොහැකි නිසා වෙන්දේසි විකිණීම් වටිනාකම අඩුකිරිම ගිණුම්ගත කර ඇත. | භාණ්ඩවල පිරිවැය ගිණුම්වලට ගැලපිය යුතුය. |
| (උ) | සභාවට අයත් ඉඩම් මැනීම සඳහා අධීක්ෂණ ගාස්තු රු.331,000ක් මිනුම් දෙපාර්තමේන්තුවට ගෙවා තිබුණත්, ඉඩම් 10ක මැනුම් ප්ලැන ලබාගෙන නොතිබුණි. | ඒ සඳහා මැනුම් කටයුතු කඩිනමින් සිදුකර ඉඩම් ප්ලැන ලබාගැනීමට අප විසින් ක්‍රියාමාර්ග ගෙන ඇති බව කාරුණිකව දන්වා සිටිමි. | සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඌ) | පළාත්පාලන දෙපාර්තමේන්තුව විසින් මෙම ප්‍රාදේශීය සභාවට රු. මිලියන 01ක් කාබනික පොහොර නිෂ්පාදනය සඳහා මුදාහැර තිබූ අතර වියදම් සිදුකර තිබූ නමුත් විකුණුම් කිසිවක් සිදුවී නොතිබුණි. | කාබනික පොහොර නිෂ්පාදනය සඳහා සලසා තිබූ අරමුදල් නිදහස් කර ඉඩම වටා වැට ඉදිකිරීමට භාණ්ඩ මිලදී ගෙන තිබූ නමුත්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඉඩම් ලබාදීමේදි සිදුවූ කාලප්‍රමාදයන් හේතුවෙන් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කාලප්‍රමාදයන් සිදුවිය. | අදාල අරමුණු සඳහා උපයෝජනය කළ යුතුය. |
| (එ) | ඉඩම් හා ගොඩනැගිලි සහ ප්‍රධාන කාර්යාල ගොඩනැගිලි එකතුව රු. 168,857,613ක් වූ වත්කම් සඳහා ඉඩම් හිමිකම් ඔප්පු සහ හිමිකාරිත්වය සනාථ කිරීමේ ලියකියවිලි ලබාගැනීමට සභාවේ කළමනාකරණය විසින් පියවර ගෙන නොතිබුණි. | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සමග ඉඩම් පැවැරීම සම්බන්ධ ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සිදුකෙරෙන බව කාරුණිකව දන්වා සිටිමි. | මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර ඇති වටිනාකමට අදාල ලියවිලි ලබාගත යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුවූවත්, 2021 දෙසැම්බර් 31 දින දක්වා කාරණා 05ක් සඳහා පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි. | අතුරු ව්‍යවස්ථා පිළියෙල කිරීම සම්බන්ධයෙන් මූලික වටයේ සාකච්ඡා අවසන් කර කෙටුම්පත් කළ කාරණා අතුරු ව්‍යවස්ථා ලෙස පවතී. මේ සඳහා අනුමැතිය ලබාගැනීමේ ක්‍රියාවලියේ පවතින බව ඔබ වෙත දන්වා සිටිමි. | අතුරු ව්‍යවස්ථා පනවා අදාළ කටයුතු නියාමනය කළයුතුය. |

## 3.3 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) නඩත්තුව සහ අළුත්වැඩියා සිදුනොකිරීම** | | |
| සභාවේ ගලි රථය (Gully Bowser) අළුත්වැඩියා කර නොතිබුණි. | මෙය තම්බලගමුව ප්‍රාදේශීය සභාවට ලබාදීමට සහා තීරණයක් ගෙන ඇත. | අළුත්වැඩියා සිදුකර මෙහෙයුම් සඳහා භාවිතා කළ යුතුය. |
| **(ආ) නිෂ්කාර්ය වත්කම්** | | |
| i) පුද්ගලික ඉඩම් කට්ටි කිරීමේදී ප්‍රාදේශීය සභාවේ පොදු භාවිතය සඳහා වෙන්කළ අක්කරයක් වපසරියකින් යුත් ඉඩම් ප්‍රාදේශීය සභාව විසින් කිසිදු පොදු/සාමාන්‍ය භාවිතයක් සඳහා යොදවා නොගෙන වර්ෂ 04කටඅධික කාලයක් නිෂ්කාර්යව පැවැතුණු බව නිරීක්ෂණය විය. | අප සභාවේ වාහන අළුත්වැඩියා වැඩපලක් සහ ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ වාහන නැවතුම්පළ ඉදිකිරිමටත් සුදුසු අයුරින් යොදවා ගැනීමට, රාජ්‍ය නොවන ආයතනවල මූල්‍යාධාර ලැබෙන අවස්ථාවල අදාල ඉඩම සභාවේ භාවිතයට යොදවා ගැනීමට අපේක්ෂා කර ඇත. | සම්පූර්ණයෙන්ම ප්‍රයෝජනයට ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |
| ii) උප්පුවෙලි හි 2018 වර්ෂයේ රු.8,250,762කට ඉදිකළ විකුණුම් මධ්‍යස්ථානය සමාලෝචිත වර්ෂයේ කුලියදී නොතිබූ අතර එමගින් රු.123,000ක වාර්ෂික කුලියක් සභාවට අහිමි වී තිබුණි. | උප්පුවෙලි 3 කණුව හන්දියේ ඉදිකර ඇති නව ගොඩනැගිල්ලේ කුලිය දෙපාර්තමේන්තු තක්සේරු කිරීම් අනුව කුලිය තක්සේරු කර ඇත. | සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |
| **(ඇ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය** | | |
| 2018 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයේදි සභාව විසින් නඩත්තු කරන සාම්බල්තීවු සහ උප්පුවෙලි පුස්තකාලවල පිළිවෙලින් පොත් 1021ක් සහ 229ක් නැතිවී ගොස් තිබූ බව අනාවරණය කළ නමුත් ඒ පිළිබඳව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව සුදුසු ක්‍රියාමාර්ග ගනු ලැබේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 සැප්තැම්බර් 29 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයේ 2.1 ට අනුව ප්‍රාදේශීය සභා සභාපති වරයා සහ ප්‍රාදේශීය ලේකම් වරයා විසින් නම් කරනු ලබන නියෝජිතයින් තිදෙනෙකුගෙන් සමන්විත කමිටුවක් මගින් නිර්දේශ ලබානොදී ප්‍රජා සංවර්ධන නිලධාරීන්ගේ නිර්දේශ මත එකතුව රු.63,735,495ක කොන්ත්‍රාත් අනුමත සමිතිවලට පිරිනමා තිබුණි. | ඔබ විසින් ලබාදෙනු ලබන උපදෙස් ඉදිරි කාලයේ අනුගමනය කරනු ලබන බව දන්වා සිටිමි. | සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 3.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2021 වර්ෂයට අදාල එකතුව රු.8,907,755ක ව්‍යාපෘති කාර්යයන් 15ක් සමාලෝචිත වර්ෂයේ අවසන් කළයුතු වුවත්, සම්පූර්ණ කර නොතිබුණි. | සිමෙන්ති හිඟය සහ ඇතැම් ඉදිකිරීම් ද්‍රව්‍ය මිල ගණන් හදිසියේ ඉහළයාම හේතුවෙන් කොන්ත්‍රාත්කරු විසින් සංශෝධිත නව ඇස්තමේන්තු විමසීම් කර ඇත. | නියමිත කාල රාමුව තුළ සම්පූර්ණ කිරීමට පියවර ගත යුතුය. |

## 3.6 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| **සේවක පුරප්පාඩු සහ අතිරික්තයන්** | | |
| ප්‍රාථමික මට්ටමේ තනතුරු 21ක පුරප්පාඩුත්, ද්විතියික මට්ටමේ තනතුරු 05ක පුරප්පාඩුත් වශයෙන් පුරප්පාඩු 26ක් පුරවා නොතිබුණි. | තනතුරු පුරප්පාඩු පිරවීමට ඉදිරි කාලයේ පියවර ගනු ලැබේ. | පුරප්පාඩු පිරවීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

# 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

## 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2021 ඔක්තෝබර් 25 දිනැති අංක PT/14/2021 දරන නැගෙනහිර පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛයට පටහැනිව සභාව විසින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන, 2022 මාර්තු 16 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි. එසේම, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) උපවගන්තියට අනුව වාර්ෂික කාර්යසාධන වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර නොතිබුණි. | උප්පුවෙලි උපකාර්යාලයේ සිදුවූ මූල්‍ය වංචාව හේතුවෙන් හිඟහිටි ගණනය කිරීමේ සිදුවූ කාල ප්‍රමාදය සහ නිලධාරීන්ගේ ස්ථානමාරුවීම් හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන 2022 මාර්තු 16 දින ඉදිරිපත් කර තිබුණී. | නියමිත කාලයේ ඉදිරිපත් කළ යුතුය. |

## 4.2 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ 2005 නොවැම්බර් 08 දිනැති අංක 03 දරන පළාත්පාලන ප්‍රතිසංස්කරණ චක්‍රලේඛයේ සඳහන් | මේ සම්බන්ධයෙන් උපදෙස් ලබා විගණන සැලැස්ම සකස් කිරිමට සුදුසු ක්‍රියාමාර්ග ගනු ලබන බව දන්වා සිටිමි. | උචිත ක්‍රියාමාර්ග ගත යුතුය. |

පරිදි සභාවේ අභ්‍යන්තර විගණකවරයා විසින් අභ්‍යන්තර විගණන සැලැස්මක් සකස් කර නොතිබුණි.

**4.3 විගණන හා කළමනාකරණ කමිටු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක DMA/2019-01හි 5.3 වගන්තිය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් අවම වශයෙන් කාර්තුවකට වරක් පැවැත්විය යුතු බව සඳහන් වුවත් සමාලෝචිත වර්ෂයේ සභාව විසින් කමිටු රැස්වීම් 03 ක් පමණක් පවත්වා තිබුණි. | ප්‍රවර්තන වර්ෂයේ කාර්තුවකට වරක් පවත්වනු ලබන බව දන්වා සිටිමි. | චක්‍රලේඛ ප්‍රකාරව උචිත ක්‍රියාමාර්ග ගත යුතුය. |

**4.4 පාරිසරික ගැටළු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව විසින් සභා බලප්‍රදේශයෙ රැස්කරන කසල වර්ගීකරණය නොකර කැලෑ පෙදෙසකට බැහැර කරනු ලබන අතර සභාව විසින් ඝන අපද්‍රව්‍ය කළමනාකරණය විධිමත්ව ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන නොතිබුණි. | ඝන අපද්‍රව්‍ය අවසාන වශයෙන් බැහැර කරන ස්ථානය අප සභාවට වෙනමම ලබාදුන් අවස්ථාවක වර්ගීකරණය ක්‍රියාවලිය සිදුකරනු ලැබේ. | උචිත ක්‍රියාමාර්ග ගත යුතුය. |

**4.5 තිරසාර සංවර්ධන අරමුණු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 අංක 19 දරන තිරසාර සංවර්ධන අරමුණු පනත ප්‍රකාරව 2030 වර්ෂයේ ළඟාකර ගතයුතු තිරසාර සංවර්ධන සැලසුම් සභාව විසින් පිළියෙල කර ඒ සම්බන්ධ ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | පනත ප්‍රකාරව තිරසාර සංවර්ධන ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම පිළියෙල කර සභාවේ අනුමැතිය ලැබී ඇත. | පනත ප්‍රකාරව උචිත ක්‍රියාමාර්ග ගත යුතුය. |